බණ්ඩාරවෙල මහා නගර සභාව
බදුල්ල දිස්ත්‍රික්කය
-------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මැයි 22 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දිනද සභාවට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරවෙල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු.2,229,117 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | 2019 වර්ෂයේදී මෙම ගිණුම්කරණ අඩුපාඩුව පරීක්ෂා කර බලා නිවැරදි කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු.354,579 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | 2019 වර්ෂයේදී මෙම ගිණුම්කරණ අඩුපාඩුව පරීක්ෂා කර බලා නිවැරදි කරමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ පරිසර බලපත්‍ර ගාස්තු ආදායම රු.55,800 ක් වැඩියෙන් ගිණුම් ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | 2019 වර්ෂයේදී මෙම ගිණුම්කරණ අඩුපාඩුව පරීක්ෂා කර බලා නිවැරදි කරමි. |
| (iv) | ගෙවිය යුතු සේවක ඇප තැන්පතු ගිණුමට ගිණුම් ගත කළ රු.23,516 ක් ආයෝජන පොලී ගිණුමට ගිණුම් ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතුවේ. | 2019 වර්ෂයේදී මෙම ගිණුම්කරණ අඩුපාඩුව පරීක්ෂා කර බලා නිවැරදි කරමි. |
| (v) | ගිණුම් විෂයයන් 04 කට අදාල ශේෂ ඒවාට අදාල විස්තරාත්මක උපලේඛන වල ශේෂ සමඟ සැසඳීමේදී රු.3,217,851 ක වෙනසක් විය. | මූල්‍ය ප්‍රකාශන වල ශේෂ විස්තරාත්මක උපලේඛන වල ශේෂ වලට සමාන විය යුතුවේ. | මෙම අඩුපාඩුව පරීක්ෂා කර බලා ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) <u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම.</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.3,051,552 ක වත්කම් විෂයයක් හා රු.12,975,969 ක වගකීම් විෂයයක් විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් ඉදිරිපත් කිරීමේදී සියළුම සාක්ෂි විගණනයට ඉදිරිපත් කරමි. |

1.4 <u>අනුකූල නොවීම</u>

<u>නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම</u>

| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) මහා නගර සහා ආඥා පනත | | | |
| (i) 218 වගන්තිය | එක් එක් මුදල් වර්ෂය අවසානයේදී මහා නගර සභාවේ පරිපාලනය පිළිබඳව සවිස්තර වාර්තාවක් සභාව වෙත හා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | ඉදිරි මුල්‍ය වර්ෂයේ සිට ආඥා පනතේ 218 වන වගන්තිය ප්‍රකාරව සකස් කර ඉදිරිපත් කරමි. |
| (ii) 227 වගන්තිය | සමාලෝචිත වර්ෂයේදී බදු දුන් වෙළඳසැල් 289 ක් සම්බන්ධයෙන් ලිඛිත ගිවිසුම් වලට එළඹ නොතිබුණි. | මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | අදාල පාර්ශව සමඟ ලිඛිත ගිවිසුම් ඇතිකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 01 පරිච්ඡේදයේ 1.2.1 ඡේදය | සමාලෝචිත වර්ෂයේ පොදු වැසිකිළි 04 ක් ටෙන්ඩර් පටිපාටිය අනුගමනය නොකර කුලියට ලබාදී තිබුණි. | ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය අනුව කටයුතු කළ යුතුවේ. | ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයට අනුව ටෙන්ඩර් කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සභාව සතු වාහන 26 ක ඉන්ධන දහනය පිළිබඳව පරික්ෂා කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව අදාල කටයුතු කළ යුතුවේ. | ඉදිරි වර්ෂ වලදී එසේ සිදු කරමි. |
| (ඈ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය | සභාව විසින් බාහිර පාර්ශවයකට ලබාදී ඇති වෙළඳසැල් 563 ක වටිනාකම වසර 5කට වරක් තක්සේරු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව අදාල කටයුතු කළ යුතුවේ. | අදාල වෙළෙඳසැල් වල වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කරමින් පවතී. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ අදායම රු.60,974,078 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.93,183,576 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 23,235,000 | 27,138,140 | 26,003,881 | 1,134,259 | 26,405,000 | 26,405,000 | 21,163,827 | 12,561,003 |
| (ii) | කුලී | 30,162,000 | 48,900,730 | 40,360,002 | 8,540,728 | 33,032,000 | 33,032,000 | 22,965,516 | 28,147,202 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 8,314,000 | 9,812,705 | 9,812,705 | - | 7,810,000 | 7,810,000 | 7,957,957 | (147,957) |
| (iv) | වෙනත් ආදායම් | 28,991,000 | 51,701,653 | 40,783,444 | 10,918,209 | 19,019,000 | 19,019,000 | 25,551,453 | (4,199,645) |
| | එකතුව | 90,702,000 | 137,553,228 | 116,960,032 | 20,593,196 | 86,266,000 | 86,266,000 | 77,638,753 | 36,360,603 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු.137,553,228 ක් වූ මුළු ආදායමින් වර්ෂය අවසාන වන විට රු.20,593,196 ක් අයකර නොතිබුණු අතර එය මුළු බිල්කළ ආදායමෙන් සියයට 15 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | හිඟ ආදායම් 2019 වර්ෂයේදී සම්පූර්ණයෙන් අයකර ගැනීමට සැලසුම් සකස් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වසරකට අධික කාලයක සිට පැවත එන හිඟහිටි වරිපනම් රු.10,726,995, හිඟහිටි ප්‍රාග්ධන ආධාර රු.2,647,126 සහ හිඟහිටි වෙනත් ආදායම් රු.109,015,417 ක් ලෙස එකතුව රු.122,389,538 ක් අය කරගෙන නොතිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

2.2.3 <u>වරිපනම් හා බදු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු.27,138,140 ක් වූ වරිපනම් හා බදු ආදායමින් දෙසැම්බර් 31 දිනට රු.1,134,259 ක් අය කර නොතිබුණි. | හිඟ වරිපනම් අයකර ගත යුතුවේ. | හිඟ වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කරන බව. |

2.2.4 <u>හිඟ ආදායම් අය කර ගැනීම</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු.48,900,730 ක් වූ මුළු කුලී ආදායමින් වර්ෂය අවසාන වන විට රු.8,540,728 ක් අයකර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | හිඟ ආදායම් 2019 වර්ෂයේදී සම්පූර්ණයෙන් අයකර ගැනීමට සැලසුම් සකස් කර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ බිල්කරන ලද රු.51,701,653ක් වූ මුළු වෙනත් ආදායමින් වර්ෂය අවසාන වන විට රු.10,918,209 ක් අයකර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | හිඟ ආදායම් 2019 වර්ෂයේදී සම්පූර්ණයෙන් අයකර ගැනීමට සැලසුම් සකස් කර ඇත. |

2.2.5 <u>මුද්දර ගාස්තු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති හිඟ මුද්දර ගාස්තුව රු.7,827,500 ක් අයකර නොතිබුණි. | හිඟ මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | 2019 වර්ෂයේදී හිඟ මුද්දර ගාස්තු ආදායමෙන් රු.3,909,000 ක් අයකර ගෙන ඇති අතර ඉතිරි මුදල්ද අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කාර්ය සාධනය</u>

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u><br>සභාව එක්සත් ජාතින්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව දැනුවත්වී තිබුණද, සභාවට අදාල කරගත හැකිවන පරිදි හඳුනාගෙන තිබුණු තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක මැනීමට දර්ශක හඳුනාගෙන ඒ අනුව වාර්ෂිකව ඉලක්ක ලගා කර ගැනීමේ ප්‍රගතිය මැනිය යුතුවේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පැහැදිලිව හඳුනා ගෙන හා ඒවා මැනීම සඳහා දර්ශකද හඳුනාගෙන ඉදිරියේදී කටයුතු කරමි. |
| (ආ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u><br>සමාලෝචිත වර්ෂය සඳහා සභාව ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කරමි. |

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් කෝපියාවත්ත ඉඩම පුද්ගලයින් 24 දෙනෙකුට දිගුකාලීන බදු පදනමට 1987 සිට ලබාදී ඇති අතර ඒ සඳහා අයකර ගත යුතු රු.4,881,060 ක හිඟ බදු මුදල අයකර ගෙන නොතිබුණි. | සියළුම හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වර්තමානයේදී මෙම මුදල් අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. |
| (ආ) | වසරකට අධික කාලයක සිට පැවත එන වියදම් ණයහිමියෝ රු.5,235,916 ක් හා කර්මාන්ත ණයහිමියන් රු.5,660,412 ක් සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | මුදල් ප්‍රතිපාදන ලබාගත් පසුව මෙම ගෙවිය යුතු ශේෂ නිරවුල් කරමි. |

3.3 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | <u>කාර්ය මණ්ඩලය අනුමත කර නොගැනීම</u><br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තනතුරු 04 කට අදාල අතිරික්ත කාර්ය මණ්ඩලය 10 ක් විය. | අතිරික්ත කාර්යමණ්ඩලය අනුමත කර ගත යුතුවේ. | අතිරික්ත තනතුරු අනුමත කර ගැනීමට කටයුතු කරමි. |

(ආ) <u>කාර්ය මණ්ඩල පුරප්පාඩු</u>

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ තනතුරු 24 කට අදාලව පුරප්පාඩු 76 ක් පැවතුනි. | කාර්යමණ්ඩලයේ පුරප්පාඩු පිරවිය යුතුවේ. | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට කටයුතු කරමි. |

3.4 <u>ප්‍රසම්පාදනය</u>

<u>ප්‍රසම්පාදන සැලැස්ම</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂයේදී ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කරමි. |

4. <u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>

4.1 <u>විගණන හා කළමනාකරණ කමිටු</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ජී/2009(01) දරන චක්‍රලේඛය අනුව කාර්තුවකට වරක් හෝ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු 02 ක් පමණක් පවත්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | 2019 වර්ෂයේදී කාර්තුවකට 01 බැගින් විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට කටයුතු කරමි. |